# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2014 අගෝස්තු මස 01 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2014. 08. 04 දින නිකුත් කරන ලදී)**


## මහනගර සභා (සංශෝධන)

**(252 වන අධිකාරය වූ) මහනගර සභා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගේ නියමය පරිදි පල කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

**මිළ : රු. 3.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් (252 වන අධිකාරය වූ) මහනගර සභා ආඥාපනතේ 215අ වන වගන්තිය, එම වගන්තියේ අතුරු විධානය ඉවත් කිරීම මගින් සංශෝධනය කරනු ලබන අතර, එසේ ඉවත් කිරීම හේතුකොටගෙන ඇතිවන නීතිය බලපෑම වනුයේ අයවැයක් හෝ පරිපූරක අයවැයක් තවදුරටත් සලකා බැලීම සඳහා මහනගර සභාව වෙත නැවත ඉදිරිපත් කිරීමේ දී මහනගර සභාව විසින් අනුගමනය කරන ලද කාර්ය පටිපාටියට නැවත අවතීර්ණ වීම වේ.

# මහනගර සභා (සංශෝධනය)

එල්. ඩී.—ඕ. 3/2014

**(252 වන අධිකාරය වූ) මහනගර සභා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

**1.** මේ පනත 2014 අංක දරන මහනගර සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට එය බලාත්මක විය යුතු ය.

(252 වන අධිකාරය වූ) මහනගර සභා ආඥා පනතේ 215අ වගන්තිය සංශෝධනය කිරීම.

**2.** 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත මගින් අවසන්වරට සංශෝධිත (252 වන අධිකාරය වූ) මහනගර සභා ආඥාපනතේ 215 අ වගන්තියේ අතුරු විධානය ඉවත් කිරීම මගින් එම වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.